# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,089 — 1934ක්වූ නොවැම්බර් මස 9 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

**1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.**

නිරවුල්කිරීමේ දැන්වීම නො. 921 (කුරුණෑගල).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත් නොකොළොත් එකී ඉඩම රජසන්තක ඉඩම කැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් මගංයන් ගෙණ ඊට කටයුතුකරන බවද, එකී ආඥාපණතේ 4වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1934ක්වූ සැප්තැම්බර් මස 11වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

ඇන්. ඊ. ආර්නල්ඩ්,
කුරුණෑගල දිස්ත්‍රික්කේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

(a) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු වයඹ දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

(b) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන පාරකට අයිතිකම්කිම ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කිම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මෙහි පහත සඳහන් බිම්කැබලි වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙනිහත්පත්තුවේ උඩපොල ඕගොට බස්නාහිර කෝරලේ වීරගල පිහිටා තිබේ :—

නොම්බර 7,171 දරණ මූල් සිතියම.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | විස්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 | බෝගහහේනේමූකලාන .. | 49 | 1 | 28 |
| 2 | ඉලුකේහේන .. | 13 | 0 | 28 |
| 3 | බෝගහහේනේමූකලාන .. | 0 | 1 | 22 |
| 4 | ඉඹුලේගහමූලහේන .. | 7 | 2 | 3 |
| 5 | එම .. | 9 | 0 | 26 |
| 6 | දෙල්ගහමූලහේන .. | 4 | 3 | 23 |
| 7 | දන්ගහමූලහේන .. | 5 | 2 | 2 |
| 8 | මාරගහමූලහේන .. | 8 | 2 | 0 |
| | | 98 | 2 | 12 |

මීට මායිම්—උතුරට ඇස්. ඇම්. පුංචිරාල උරුමකියන ගෙඩිනලගාවාවත්ත, ඇස්. ඇම්. පුංචිරාලට අයිති නොම්බර 376,002 දරණ පිඹුරේ සඳහන් ඉඩමද, ඇස්. ඇම්. ලපහාමිගේ උරුමක්කාරයෝ උරුමකියන වතුවලතැන්නේවත්තද, ඇස්. ආර්. පිකිරිබංඩාට අයිති නොම්බර 313,070 දරණ පිඹුරේ සඳහන් ඉඩමද, ඇස්. ඇම්. මානෙල්හාමිට අයිති නොම්බර 314,656 දරණ පිඹුරේ සඳහන් ඉඩමද, ඒ. ඇම්. කිරිබංඩා සහ තවත් අය උරුමකියන බතලගොල්ලේහේනද, ඒ. ඇම්. පියසිරිබංඩාට අයිති නොම්බර 310,684 දරණ පිඹුරේ සඳහන් ඉඩමද, ඇස්. ඇම්. බාලහාමි උරුමකියන කන්දේහේනේ වත්තද, ඇස්. ඇම්. බාලහාමි උරුමකියන ගල්බක්කේ හේනද, ඒ. ඇම්. කිරිබංඩා සහ තවත් අය උරුමකියන ගල් බක්කේහේනේවත්තද, ඒ. ඇම්. කිරිබංඩා සහ තවත් අය උරුමකියන එරියමඩුරඹද; නැගෙණහිරට ඇලපාකන්දේ ගම්ඉඩමද, ඩී. ඩබ්ලිව්. පෙරේරාට අයිති නොම්බර 375,940 දරණ පිඹුරේ සඳහන් ඉඩමද, නොම්බර 633 දරණ ලංකා බැණීංමේ මූල් සිතියමෙන් උපුටාගන්නාලද 1වෙනි කොටසේ සඳහන් නොම්බර 1 දරණ ආණ්ඩුව සහ කිරිබංඩිරාල උරුම කියන ගල්ගෙය්ගාවාහේනද, යෝගාමුවාකන්දේ ගම්ඉඩමද; දකුණට නොම්බර 7,171 දරණ මූල් සිතියමේ සඳහන් නොම්බර 11 දරණ ආණ්ඩුව සහ රංමැණිකා උරුමකියන බෝගහ හේනද, නොම්බර 7,171 දරණ මූල් සිතියමේ සඳහන් නොම්බර 10 දරණ කිරිබංඩා උරුමකියන දෙවිරුන්හේන නොහොත් දන්ගහමූලහේනද, නොම්බර 7,171 දරණ මූල් සිතියමේ සඳහන් නොම්බර 9 දරණ ආණ්ඩුව සහ උක්කුබංඩා උරුමකියන දෙවිරුන්හේනද, ඇලපාකන්දේ ගම්ඉඩමද; බස්නාහිරට ඇලපාකන්දේ ගම්ඉඩමද. ඇස්. ඇම්. මුදලිහාමි උරුම කියන වතුවලතැන්නේවත්තද වේත්.

---

**1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.**

නිරවුල්කිරීමේ දැන්වීම නො. 922 (කුරුණෑගල).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මාවෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්

නිය යටතේ ප්‍රකාශකරණුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒව කටයුතුකරණ බව; එකී ආඥාපණතේ 4වෙනි වගන්තිය යටතේ මෙයින් දන්වනු ලැබේ.

මේ 1934ක්වූ සැප්තැම්බර් මස 11වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

ආර්. ඒ. ආර්න්ස්ට්,
කුරුණෑගල දිස්ත්‍රික්කුවේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු වයඹ දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගතහැකිය.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මෙහි පහත සඳහන් බිම්කැබැල්ල වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙණිහත්පත්තුවේ උඩපොල ඕතොට නැගෙණහිරකෝරලේ යෝගොමුවාකන්දේ පිහිටා තිබේ :—

නො. 7,171 දරණ මුල් සිතියම.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 12 | බෝගහහේන .. | .. 0 1 38 |

මීට මායිම්—උතුරට වීරගල ගම්ඉම්ද; නැගෙණහිරට නොම්මර 7,171 දරණ මුල් සිතියමේ සඳහන් නොම්මර 13 දරණ ආණ්ඩුව සහ ඇස්. ඒ. රංමැණිකා සහ තවත් අය උරුමකියන ගෝනඹෙඩිවත්තද; දකුණට සහ බස්නාහිරටත් වීරගල ගම්ඉමද වේත්.

---

1931 ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 923 (කුරුණෑගල).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1934ක්වූ නොවැම්බර් මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මාවෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම් රජසන්තක ඉඩම්කැයි 1931 ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තියයටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒව කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වෙනි වගන්තිය යටතේ මෙයින් දන්වනු ලැබේ.

මේ 1934ක්වූ සැප්තැම්බර් මස 11වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

ආර්. ඒ. ආර්න්ස්ට්,
කුරුණෑගල දිස්ත්‍රික්කේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

(*a*) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු වයඹ දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මෙහි පහත සඳහන් බිම්කට්ටි වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙණිහත්පත්තුවේ උඩපොලඕතොට නැගෙනහිරකෝරලේ අරගොඩ පිහිටා තිබේ :—

නොම්මර 7,558 දරණ මුල් සිතියම.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 6 | ගල්ලව්ඩිගේහේන | .. | 0 | 3 | 25 |
| 7 | එම | .. | 0 | 2 | 28 |
| 8 | විහාරේහේන | .. | 0 | 3 | 38 |
| 9 | එම | .. | 1 | 0 | 9 |
| 10 | පනවැල්ලගහමුලහේන | .. | 0 | 3 | 9 |
| 11 | කුඩාපොලේවත්ත | .. | 0 | 3 | 7 |
| 12 | පොල්කටුවේමුකලාන | .. | 67 | 0 | 7 |
| 13 | හම්බන්හේනේවත්ත | .. | 0 | 0 | 6 |
| 14 | එම | .. | 0 | 0 | 4 |
| 15 | කුඩාපොලේවත්ත | .. | 0 | 0 | 15 |
| | | | 72 | 1 | 28 |

මීට මායිම්—උතුරට වී. සිලානන්ද උරුමකියන විහාරේ හේන, ආර්. ඩබ්ලිව්. ලමින්දුවා උරුමකියන පනවැල්ලගහමුලවත්ත, ඩබ්ලිව්. පී. කිරිදුරයා උරුමකියන පනවැල්ලගහමුලවත්ත, එච්. ආර්. කිරිඅප්පු උරුමකියන මුරුතගහමුලවත්ත, මීදුම මැද්දුමාබංඩාට අයිති නොම්මර 187,266 දරණ පිඹුරේ සඳහන් ඉඩම; නැගෙණහිරට වී. ඇම්. ආර්. මැද්දුමාට අයිති කඩපොලේවත්ත, වී. ඇම්. ආර්. මැද්දුමාබංඩාට අයිති දෙනියේකුඹුර, ආණ්ඩුවට අයිති නොම්මර 614 දරණ ලංකාමැණිමේ මුල්සිතියමෙන් උපුටාගන්නාලද 3වෙනි කොටසේ සඳහන් නොම්මර 1 දරණ පොල්කටුවේ මුකලාන නොහොත් පොල්කටුකන්දේමුකලාන, වී. ඇම්. ආර්. මැද්දුමාබංඩාට අයිති කුඹල්පොලේවත්ත; දකුණට වල්ගමගම් ඉම්ද; බස්නාහිරට උඩුකේදෙණියේගම්ඉම්ද, ඇස්. පී. මැණිකා මෙල්දුරයා උරුමකියන බඳුවත්තද, ඇස්. පී. මැනිව් උරුමකියන බඳුවත්තද, ඇස්. පී. අර්නෝලියා උරුමකියන මොරගොල්ලේකුඹුරද, ඇස්. පී. අර්නෝලියා උරුමකියන මොරගොල්ලේවත්තද වේත්.

---

1931 ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 924 (කුරුණෑගල).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1934ක්වූ නොවැම්බර් මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මාවෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම් රජසන්තක ඉඩම්කැයි 1931 ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරණුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒව කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දන්වනු ලැබේ.

මේ 1934ක්වූ සැප්තැම්බර් මස 11වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

ආර්. ඒ. ආර්න්ස්ට්,
කුරුණෑගල දිස්ත්‍රික්කේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

(*a*) මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු වයඹ දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මෙහි පහත සඳහන් බිම්කැබලි වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ උඩපොලඕතොට නැගෙනහිරකෝරලේ උඩුකේදෙණියේ පිහිටා තිබේ.

නොම්මර 7,558 දරණ මුල් සිතියම.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 1 | පිලගොල්ලේහේන | .. | 0 | 1 | 15 |
| 2 | පොල්කටුවේමුකලානේන්යැරකොප්පුව | .. | 1 | 0 | 37 |
| 3 | එම | .. | 0 | 3 | 36 |
| 4 | පොල්කටුවේමුකලාන | .. | 50 | 3 | 29 |
| 5 | හබන්හේනේවත්ත | .. | 0 | 0 | 10 |
| | | | 53 | 2 | 7 |

මීට මායිම්—උතුරට ඇස්. පී. සෙලේනා සහ තවත් අය උරුමකියන බෝගහමුලවත්තද, ඇස්. පී. මුතුවා සහ තවත් අය උරුමකියන කලුකොහොපිටියේවත්තද, ඇම්. පී. විලියා උරුමකියන බතලහේනේවත්තද, ඇස්. පී. ජෝනා උරුමකියන කහටගහවත්තද, ඇස්. පී. අයිසෙක් උරුමකියන වාගොල්ලේවත්ත සහ කහටගහවත්තද, ඇම්. පී. කිරිදුරයා උරුමකියන පතහගහමුලවත්තද, ඇස්. පී. හොරතලා උරුමකියන දවටගහමුලවත්තද, ඒ. පී. කිරිබංඩියා සහ තවත් අය උරුමකියන බිලිංවගහමුලවත්තද, ඇම්. පී. විලියා සහ තවත් අය උරුමකියන මල්ලහේනේවත්තද, එච්. පුංචිරාල සහ තවත් අය උරුමකියන ඕංගාගේවත්තද; නැගෙණහිරට අරගොඩ ගම්ඉම්ද; දකුණට ගොඩිගමුවේගම්ඉම සහ වී. ඒ. ජයසුන්දර උරුමකියන පොල්කටුවේහේනේවත්තද; බස්නාහිරට ඩබ්ලිව්. ඇම්. පුංචිඅප්පුහාමි උරුමකියන පිලගොල්ලේවත්තද, ඇස්. පී. ජෝනා උරුමකියන පිලගොල්ලේවත්තද වේත්.

---

1931 ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 925 (කුරුණෑගල).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1934ක්වූ නොවැම්බර් මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මාවෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම් රජසන්තක ඉඩම්කැයි 1931 ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒව කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දන්වනු ලැබේ.

මේ 1934ක්වූ සැප්තැම්බර් මස 11වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

ආර්. ඒ. ආර්න්ස්ට්,
කුරුණෑගල දිස්ත්‍රික්කේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**Hambantota No. 99.**—දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1935ක්වූ ජනවාරි මස 28වෙනි දිනවූ සඳුදා සවස 3ට තිහව තානායමේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම්පත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

622 දරන සිතියම. ගම—දෙබරවැව.

| නො. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|
| 85AB | දෙබරවැවකැලේ .. | ආණ්ඩුව, කිරින්දේ ඒ. ඇල්. ඇම්. මන්සූර් ඉල්ලම් කර තිබේ | කැලේ .. | 0 3 0 | —* |
| | | 636 දරන සිතියම. ගම—මාගම. | | | |
| 88 | පිටපැලැස්ස .. | ආණ්ඩුව, මාගම පදිංචි දෙදුන් හෙන්ද්‍රික් මහානාම සිරිවර්දන ඉල්ලම්කර තිබේ | පාරකට ඇර තිබූන පරන තහනම් කැබැල්ල | 0 0 14 | 24† |

* සේරම රු. 60. † අඩුම ගනන රු. 4.

මේ ඉඩම් ගැන වැඩිදුර කාරණා හම්බන්තොට උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැක.

වෂී 1934ක්වූ නොවැම්බර් මස 3වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෙයින්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**Hambantota No. 103.**—දකුනු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1935ක්වූ ජනවාරි මස 5වෙනි දිනවූ සෙනසුරාදා උදේ 9ට අම්බලන්තොට තානායමේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. දකුනු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම්පත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

මුල් සිතියමේ නො. 61. ගම—වලගේ.

| නො. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 17O | රෙබ්මුල්ලකැලේ .. | වලගේ ඩබ්ලිව්. සපනා විසින් අල්ලාගෙන තිබේ | වත්ත, ගොඩනැගිල්ලක් සහ අවුරුදු 6ක් පමන දොඩන්ගස් තිබේ | 0 0 23 | 72 |
| 17D | සියඹලාගහලන්ද .. | එම .. .. | අවුරුදු 10ක පමන මුරුංගාද අවුරුද්දක පමන පොල්ගහක්ද ඇති හේන | 0 1 14 | 72 |
| 17N | පොල්ගහවත්ත .. | වලගේ පදිංචි පී. නන්ද, ලේ. සනිපා සහ ඩබ්ලිව්. සපනා විසින් අල්ලාගෙන තිබේ | මුරුංගාගස්වවා තිබෙන හේන | 0 0 31 | 72 |
| 17Z | කොස්වත්ත .. | වලගේ පදිංචි ඩබ්ලිව්. සපනා විසින් අල්ලාගෙන තිබේ | මුරුංගාගස්වවා තිබෙන වත්ත | 0 0 9 | 72 |

මේ ඉඩම් ගැන වැඩිදුර කාරනා හම්බන්තොට උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වෂී 1934ක්වූ නොවැම්බර් මස 3වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෙයින්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**Hambantota No. 104.**—දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1935ක්වූ ජනවාරි මස 5වෙනි දිනවූ සෙනසුරාදා උදේ 9ට අම්බලන්තොට තානායමේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවාපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

මුල් සිතියමේ නො. 454. ගම—උඩකනුකැටිය.

| නො. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1OK | කිරිබත්ආර .. | හාතාගල විජේගොඩ සුමන්ගල තෙරුන්නාන්සේ විසින් අල්ලාගෙන තිබේ | හේන සහ කුඹුර | 0 1 27 | 60 |
| | | | දඩය .. | — | 5 |
| | | මුල් සිතියමේ නො. 460. ගම—මිහිඇතිලිය. | | | |
| 21AA | බටුලන්දේවත්ත .. | මිහිඇතිලියේ පදිංචි ඇෂ්. පී. එන්ගෝහාමි විසින් අල්ලාගෙන තිබේ | දෙහිගස් සහ කෙසෙල් වවා තිබෙන වත්ත | 0 0 11 | —* |
| | | මුල් සිතියමේ නො. 469. ගම—හාතාගල. | | | |
| 2U5 | පළුගහකුඹුර නොහොත් දළුගහකුඹුර | හාතාගල දෙදුන් දියෝනිස් සරනසිංහ එදිරිසූරිය විසින් අල්ලාගෙන තිබේ | කුඹුර .. | 0 1 39 | 64 |
| | | | මැනුන්ගාස්තු | — | 14·01 |
| 2U6 | අඹුනගාවාවත්ත .. | හාතාගල එන්ද්‍රෙරිස් එදිරිසූරිය සහ තවත් 4 දෙනෙක් විසින් අල්ලාගෙන තිබේ | අවුරුදු 12ක් පමන පොල් සහ පුවක් තිබේ | 0 0 12 | 64 |
| | | | මැනුන් ගාස්තු | — | 6·21 |

* සම්පූර්ණයෙන් රු. 10.

මේ ඉඩම් ගැන වැඩිදුර කාරනා හම්බන්තොට උප ඒජන්ත උන්නාන්සේගෙන්ද ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වෂී 1934ක්වූ නොවැම්බර් මස 3වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෙයින්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**Hambantota No. 105.**—දකුනු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1935ක්වූ ජනවාරි මස 5වෙනි දිනවූ සෙනසුරාදා උදේ 11ට හම්බන්තොට කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. දකුනු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම් පත්තු කොටසේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

මුල් සිතියමේ නො. 14,277. ගම—හම්බන්තොට නාගරිකයතුල පිහිටි පාන්දුවල.

| නො. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | සප්පුකුලම් .. | හම්බන්තොට ඒ. ඒ. කරීම් විසින් අල්ලාගෙන තිබේ | පොල්පැල දෙකක් සහ කෙහෙල්පඳුරු කිපයක් සහිත වත්ත | 0 1 4·25 | 200 |

| නො. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නෝ. | අන්දම. ° | මහත, අ. රූ. ප. | | | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | | මුල් සිතියම් නො. A 155/H 2. ගම—සම්බන්තොට නාගරිකයතුල. | | | | | |
| 1 | මලිත්තන්කැලේ .. | ආණ්ඩුව .. .. | මුඩුඉඩම (ආණ්ඩුවට තම නමට තබාගැනීමට) | 0 | 1 | 22·55 | — |
| | | මුල් සිතියම නො. A 156/H 1. ගම—හම්බන්තොට නාගරිකයතුල. | | | | | |
| 5 | තල්බැද්දෙවත්ත, නාගරික නො. දෙකේ ඉඩමෙන් කැබැල්ලක් | පී. බී. එක්. අමන් විසින් අල්ලාගෙන තිබේ | අවුරුද්දක් පමණ වයස ඇති පොල්ගහක් ඇති වත්ත, (ආණ්ඩුවට තම නමට තබාගැනීමට) පාරකට ඇර තිබේ | 0 | 0 | 2·47 | — |

මේ ඉඩම් ගැන වැඩිදුර කාරණා හම්බන්තොට උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 3වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3 වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පමුනුවිල මිනිපිටිවෙතිය හරහා පාර වෙනස්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ. ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A. 415. ගම—පමුනුවිල සහ ගල්ඒදණ්ඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 2 | මීල්ලගහවත්ත .. | පොල්පැලයක් සහ කජුගස් 3කින් යුත් පොල්ඉඩම | කේ. ජුවන් පෙරේරා, කේ. මරියා පෙරේරා, දෙදෙනා නම ගල්ඒදණ්ඩේ, ඇම්. ජයවර්ධන ආරච්චිගෙ සයිමන් පෙරේරා, හේනහේන | 0 | 0 | 10·2 |
| 4 | තල්ගහවත්ත .. | කජුගස් 6කින් යුත් පොල් ඉඩමකින් කොටසක් | ඇම්. කේ. සිසිලියා අල්විස්, බී. එබ්‍රම් පෙරේරා, බී. සයිමන් පෙරේරා, සියල්ලම ගල්ඒදණ්ඩ | 0 | 0 | 6 |
| 5 | ගල්ඒදන්ඩයායවත්ත | පොල්පැල 7කින් යුත් පොල් ඉඩම .. | බී. දෙන් වින්සන්ට් ගල්ඒදණ්ඩ .. | 0 | 0 | 11·1 |
| 6 | යායකැලේවත්ත .. | මිරිකැලෑව (පොල් ඉඩමකින් කොටසක්) | ජේ. පී. ද සරම් ගුණතිලක .. | 0 | 0 | 4·6 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ දෙසැම්බර් මස 14වෙනි දින පෙරවරු 10යේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකාරයේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 5වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ඩබ්ලිව්. හෝල්ම්ස්,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වෙනුවට.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3 වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—අකතිමුරිප්පුවේ මහඇළේ හත්වෙනි හැතැක්මේ කොටසක් සෑදීම සහ ඊට බිමක් ඉඩුරුකරගැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 517. ගම—වෙප්පන්කුලම්.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 2 | විල්ලංකාච්චි .. | කුඹුර .. | මරිසල් තොම්මෙයි පිල්ලේ, මරිසල් සීවම් පිල්ලේගේ භාර්යාව වන අගුඹාච්චි, මරිසල් අන්තෝනි පිල්ලේ, මරිසල් මරීප්පිල්ලේ, පදිංචිය පන්නේ වෙට්ටුවන් | 2 | 1 | 1·1 |
| 4 | එම .. | එම (පාළු) .. | එම .. .. .. | 0 | 3 | 1·9 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකරතිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින පූර්වභාග 10 කනිසමට මුරුන්කන් තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි. තවද මේ ඉඩම් සම්බන්ධ මුල්ඔප්පුද ගෙනෙන්ට ඕනෑය.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 5වෙනි දින මන්නාරමේ කච්චේරියේදීය.

ආර්. ඇස්. වී. පොලියර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුවට.

---

## ඉඩම් නැවත රජසන්තක කරගැනීමේ දැන්වීම.

ඉඩම් නැවත රජසන්තක කරගැනීමේ දැන්වීම.

උතුරු පලාතේ යාපනේ දිස්ත්‍රික්කයේ වඩමරච්චි කොට්ඨාසයේ නාගර් කෝවිල් යන ගමේ පිහිටි මීට යාකරතිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් දී තිබෙන බිම්කට්ටිය දැනට අට අවුරුද්දකට වැඩි කාලයක් අයිතිකාරයින් විසින් අත්හැරදමාතිබෙන බව උතුරු පලාතේ ඒජන්තතුමාට පෙනියන බැවින්ද;

උතුරු පලාතේ ඒජන්තතුමා විසින් මේ ගැන ඉතා ඕනෑකමින් සෑහෙන පමණ විභාගකලේවිනමුත් එබඳු අයිතිකාරයන් හෝ ඔවුන් වෙනුවෙන් නීතිප්‍රකාර අයිතිවාසිකම් කියන යම් කෙනෙකු දැනගන්ට නොමැති බැවින්ද;

මේ ඉඩමට අයිතිවාසිකම් ඔප්පුකරන්ට පුළුවන් අයෙක් හෝ ඒ වෙනුවෙන් යමෙක් විසින් වර්ෂ 1934ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින පටන් මාස 12ක කාලයක් තුළ අයිතිවාසිකම් නොපෙන්නාසිටියොත් එකී ඉඩම වර්ෂ 1887යේ ඉඩම් නැවත රජසන්තකකරගැනීමේ ආඥාපණතේ 2වෙනි වගන්තිය යටතේ නැවත රජසන්තකකරගන්නා බව ඉහතකී ආඥාපණතෙන් උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමාට ලැබීතිබෙන බල ප්‍රකාර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අවසරයත් ඇතිව ප්‍රකාශකරන බව සම්බන්ධවූ සියලුදෙනාම මෙයින් දැනගනිත්වා.

1934ක්වූ ඔක්තෝබර් මස 22වෙනි දින යාපනේ කච්චේරියේදීය.

ජී. රොබර්ට්ස්,
උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

### උප ලේඛනය.

යාපනේ දිස්ත්‍රික්කයේ වඩමරාච්චි කොරළයේ කච්චෙකොවලම් යන ගමේ පිහිටි නො. 2,227 දරන ප්‍රාරම්භ සිතියමේ (නො. 187,568 දරන නාම සිතියම) නො. 8,171 දරන බිම්කට්ටිය වශයෙන් පෙන්නුම්කරතිබෙන අක්කර එකක් පමණ ප්‍රමාණ ඇති අයියන්කෝවිල්වෙලි යන ඉඩමෙන් කොටසක්.

මිට මායිම් :—උතුරට : වැලිපාර (නො. A 487 දරන ප්‍රාරම්භ සිතියමේ නො. 4 දරන බිම්කට්ටිය).
නැගෙනහිරට : කේ. මුත්තුකුමාරු අයිතිවාසිකම්කියාසිටින ඉඩම.
දකුනට : ආණ්ඩුව විසින් අයිතිවාසිකම්කියාසිටින අයියන්කෝවිල්වෙලි යන ඉඩම.
බස්නාහිරට : නැසිගිය නාකප්පර් වල්ලිපුරම්ගේ උරුමක්කාරයින් අයිතිවාසිකම්කියාසිටින ඉඩම.

---

### ඉඩම් නැවත රජසන්තක කරගැනීමේ දැන්වීම.

උතුරු පලාතේ යාපනේ දිස්ත්‍රික්කයේ වඩමරාච්චි කොරළයේ නාගර් කෝවිල් යන ගමේ පිහිටි මීට යාකරතිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ආණ්ඩුව විසින් හෝ වෙනුවෙන් දී තිබෙන බිම්කට්ටිය දැනට අට අවුරුද්දකට වැඩි කාලයක් අයිතිකාරයින් විසින් අත්හැරදමාතිබෙන බව උතුරු පලාතේ ඒජන්තතුමාට පෙනීයන බැවින්ද ;

උතුරු පලාතේ ඒජන්තතුමා විසින් මේ ගැන ඉතා ඕනෑකමින් සොයන ලමන විභාගකලේවීනමුත් එබඳු අයිතිකාරයන් හෝ ඔවුන් වෙනුවෙන් නීතිප්‍රකාර අයිතිවාසිකම් කියන සම කෙනෙකු දැනගන්ට නොමැති බැවින්ද ;

මේ ඉඩමට අයිතිවාසිකම් ඔප්පුකරන්ට පුළුවන් අයෙක් හෝ ඒ වෙනුවෙන් යමෙක් විසින් මේ 1934ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින පටන් මාස 12ක කාලයක් තුළ අයිතිවාසිකම් නොපෙන්නාසිටියොත් එකී ඉඩම වර් 1887දේ ඉඩම් නැවත රජසන්තකකරගැනීමේ ආඥාපණතේ 2වෙනි වගන්තිය යටතේ නැවත රජසන්තකකරගන්නා බව ඉහතකී ආඥාපණතෙන් උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමාට ලැබීතිබෙන බල ප්‍රකාර ආණ්ඩුකාර උතුමානන්වහන්සේගේ අවසරයත් ඇතිව ප්‍රකාශකරන බව සම්බන්ධවූ සියලුදෙනාම මෙයින් දැනගනිත්වා.

1934ක්වූ ඔක්තෝබර් මස 22වෙනි දින
යාපනේ කච්චේරියේදීය.

ඒ. රෙඩ්රිගෝ,
උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

### උප ලේඛනය.

යාපනේ දිස්ත්‍රික්කයේ වඩමරාච්චි කොරළයේ කච්චෙකොවලම් යන ගමේ පිහිටි නො. 2,227 දරන ප්‍රාරම්භ සිතියමේ (නො. 187,570 දරන නාම සිතියම) නො. 8,175 දරන බිම්කට්ටිය වශයෙන් පෙන්නුම්කරතිබෙන රූඩ් 3යි පර්චස් 36ක් ප්‍රමාණ ඇති අයියන්කෝවිල්වෙලි යන ඉඩම.

මිට මායිම් :—උතුරට : ආණ්ඩුව අයිතිවාසිකම්කියාසිටින අයියන්කෝවිල්වෙලි.
නැගෙනහිරට : ආණ්ඩුව අයිතිවාසිකම්කියාසිටින අයියන්කෝවිල්වෙලි.
දකුනට : කදිරමර් චෙව්විඩි සින්නතම්බි සහ තවත් අයින් අයිතිවාසිකම්කියාසිටින අයියන්කෝවිල්වෙලි (නො. 187,392 දරන නාම සිතියම).
බස්නාහිරට : ආණ්ඩුව අයිතිවාසිකම්කියාසිටින අයියන්කෝවිල්වෙලි.

---

### ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීමයි.

1934දේ නො. 1, හලාවත දිස්ත්‍රික්කය. (මධ්‍යම පන්තියේ ලාබ්කියන් සඳහායි.)

මෙහි පහත විස්තර සඳහන්වන ඉඩම් ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමා විසින් ඒ ඉල්ලුම්පත්‍ර ලැබුනාට පසු දැනුම්දෙනුලබන ඉඩම් කච්චේරියකදී පරීක්ෂාකොට කල්පනාවට ගන්නා බව මෙයින් දැනුම්දෙනු ලැබේ. ඉහතකී ඉඩම් සම්බන්ධ වැඩි විස්තර කරුණු පුත්තලමේ කච්චේරියෙන්ද, කුරුණෑගල මිනින්දෝරු කන්තෝරුවෙන් හෝ කොළඹ සර්වේයර් ජනරාල් කන්තෝරුවෙන්ද ඒ ඒ කන්තෝරුවල වැඩකරන කාලය තුළදී විභාගකර දැනගත හැකියි.

2. ඉල්ලුම්කරන්නට කැමති අය විසින් ඔවුන් ඉල්ලුම්කරන්නට අදහස්කරන ඉඩමේ ප්‍රමාණය හා ඉඩම ලැබුනොත් එහි දමීමට අදහස්කරන වැවිලිද සඳහන්කොට ඒ සම්බන්ධ ඉල්ලුම්පත්‍ර ලියා 1934දේ දෙසැම්බර් මස 10වෙනි දින හෝ ඊට ඉස්සෙල්ලා පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමා වෙත යැවිය යුතුයි. ඉල්ලුම්පත්‍රය සමග මුදලක් බැඳීම වුවමනා නැත. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම්පත්‍ර පිළිබඳ වැඩිමනත් කරුනු ආණ්ඩුවේ උප දිසාපතිතුමාට කියාදෙනු පිණිස ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. ඉල්ලුම්කරු හෝ ඔහු වෙනුවෙන් පෙනීසිටීමට ලියවිල්ලකින් බලයලත් අන්කෙනෙක් හෝ ඉඩම් කච්චේරියට නොපැමිණියේනම් ඔහු තම ඉල්ලීම අත්හැර දැමූ හැටියට ආණ්ඩුවේ උප දිසාපතිතුමා විසින් සලකනවා ඇත.

3. මේ ඉඩම් කොටස් වෙන්කර දෙන්නේ මධ්‍යම පන්තියේ ලාබ්කියන්ට පමණකි. මධ්‍යම පන්තියේ ලාබ්කියන් හැටියට 1932දේ ආදායම්බදු ආඥාපණතේ ප්‍රකාර 1934දේ මාර්තු මස 31වෙනිදායින් අවසන්වන අවුරුද්දට ගණන් බලනලද නීත්‍යනුකූල ආදායම රුපියල් 6,000කට වැඩිවන්නාවූ කිසිම අයෙක් ඇතුළත් නොවන්නේය. විවාහවූවන් සම්බන්ධයෙන් වූවිට ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේම නීත්‍යනුකූල ආදායම එකතුවූවිට රුපියල් 12,000කට වැඩිවෙනොත් ඒ ස්ත්‍රී හෝ පුරුෂයා මධ්‍යම පන්තියේ ලාබ්කියකුමෙන් සලකනු නොලැබේ. ඉඩම් වෙන්කරදීම අක්කර 5ත් 50ටත් අතරේ කට්ටිවලට සීමාකරනු ලැබේ.

4. මේ දැන්වීමේ ප්‍රකාර තෝරාගත් ඉල්ලුම්කරුවන්ට දෙනලද ඉඩම් කට්ටි ඉඩම් සශ්‍රීකකිරීම පිළිබඳ ආඥාපණත වලංගුවනතුරු ඒ ඉඩම්කට්ටි භුක්තිවිඳීම පහත පෙනෙන කොන්දේසි ඇතුළු තවත් එබඳු කොන්දේසි පිට පවත්නා අවසර පත්‍ර පිට වන්නේය.

(i.) අවසරපත්‍රලත් අය විසින් මේ අවසරපත්‍රය පිට තමාට පැවරෙන අයිතිවාසිකම විකිණීම හෝ වෙනයම් අන්දමකින් අන් සතුකිරීම කලින් ඒ සඳහා පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමාගෙන් අවසරයක් ලබාගෙන මිස මොනයම් කරුණක් නිසාවත් නොකට යුතුයි. තවද අවසර ලබානොගෙන කරන එබඳු ඒ කොයියම් විකිණීමක් හෝ අන්සතු පැවරීමක් ඇතහොත් එය වලංගු නොවන්නේය.

(ii.) අවසරපත්‍රලත් අය විසින් අවුරුදුපතා මුදලක් ගෙවිය යුතුයි. මුලින් ගෙවන ගණන ඉඩමේ වටිනාකමට අක්කරයකට රුපියල් 10 බැගින් මිනින්දෝරු ගාස්තුද එකතුකොට ලැබෙන ගණනින් සියයට 2කට වැඩිනොවේ. නමුත් මෙය කලින්කල වෙනස්විය හැකියි.

(iii.) අවසරපත්‍රලත් අය විසින් පළමුවෙනි තුන් අවුරුද්ද තුළ ඉඩමෙන් යටත්පිරිසෙයින් දහයෙන් තුන් කොටසක්වත් එළිකොට වැවිය යුතුයි. ඊළඟ දෑවුරුද්ද තුළ මුළු ඉඩමේ ප්‍රමාණයෙන් යටත්පිරිසෙයින් තවත් හතරෙන් කොටසක්වත් එළිකොට වැවිය යුතුයි. අවසරපත්‍රලත් අය තම අවසරපත්‍රයෙහි නියමිත කාලය තුළ ඉඩමේ සියම ප්‍රමාණයක් එළිකර වැවීමට බැඳුනේද, ඒ ප්‍රමාණයෙහි නොකඩව වැවිලි නොමිතැන් කරගෙනයායුතුයි.

(iv.) ඉඩමේ තිබෙන ලීදඬු ඉඩමේ මුරපැල් හෝ ගෙවල් තැනීම සඳහා හෝ වැටවල් බැඳීම සඳහා ගැනීමට අවසරලත් අයට බලය තිබේ. එසේත් පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමාගේ අවසරය නොමැතිව ඉඩමෙන් ලීදඬු කිසිවක් පිට ගෙනයෑමට ඔහුට බලයක් නැත. එකී ආණ්ඩුවේ උප දිසාපතිතුමාට සුදුසුයයි පෙනෙන අන්දමකට ගෙවිල්ලක් ඇතුව හෝ නැතුව ඒ සඳහා වුවමනා අවසරය දියහැකියි.

(v.) අවසරලත් අය අවසරපත්‍රයේ කොන්දේසිවලින් කොයිකක් වුවත් ඉෂ්ට නොකරහැරියොත් හැත්නම් අවසරපත්‍රලත් අයට විරුධව තිබෙන නඩු තීන්දුවක් ඉෂ්ටකිරීම පිණිස එකී ඉඩම හෝ අවසරපත්‍රලත් අයට ඇති අයිතිවාසිකම නගතමට ගතහොත් පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමාට අවසරපත්‍රය අවලංගුකොට ඉඩම සහ එහි තිබෙන යම් අස්වැන්නක්, වගාවක්, ගෙයක් හෝ වෙනයම් දියුණුකිරීමක් ඇතහොත් එය තම අත්අඩංගුවට ගතහැක ; එපමණක් නොව අවසරපත්‍රලත් අය විසින් හෝ වෙනයම් කෙනෙකු විසින් ඉඩමෙහි කරතිබෙන යම් දියුණුවක් පිළිබඳව තමන්ට සිදුවන පාඩුවක් ගැන කිසියම් ගෙවිල්ලක් ඉල්ලාසිටීමට අවසරපත්‍රලත් අයට හෝ ඔහු වෙනුවෙන් ඉල්ලුම්කරන වෙනයම් කෙනෙකුට හෝ කිසි අයිතිවාසිකමක් නැත.

(vi.) මෙහි දෙනලද ඉඩමෙන් යම් කොටසක් මංමාවත්, ඇළවල් හෝ වෙනයම් කටයුත්තක් සඳහා ආණ්ඩුවට මින්මතු වුවමනා කෙරේනම් අවසරපත්‍රලත් අය විසින් එය ගෙවිල්ලක් නොලබා භාරදිය යුතුයි.

(vii.) අවසරපත්‍රය බලපවත්නා කාලය තුළ අවසරලත් අයගේ මරණය සිද්ධවුණොත් ඔහු වෙනුවෙන් පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමා විසින් අලුත් අවසරපත්‍රයක් අයවලාට නිකුත්කළ යුතුයයි තමා කැමති අයකුගේ නම නියම කිරීමට අවසරපත්‍රලත් අයට බලය තිබේ.

(viii.) අවසරපත්‍රය එය ලත් අයට පුද්ගලිකවූවක් වේ. එය අවසන්වන්නේ ඔහුගේ මරණය සිද්ධවූවිට වේ.

(ix.) අවසරපත්‍රයෙහි කාලය අවසන්වූවිට ඉඩම නැවතත් රජයන්තක වියයුතුයි. එහි කරතිබෙන කොයිසම් දියුණුවක් ගැනවත් වන්දියක් ඉල්ලාසිටීමට කිසිම අයකුට බලයක් නැත.

(x.) අවසරපත්‍ර ලත් අයගේ මරණයෙන් අවසර පත්‍රයේ කාලය අවසන්වූවිට නැසීගිය අවසරලත් අය විසින් නම් කරනලද අය අවසරපත්‍රය ලැබීමට සුදුස්සෙක්යයි තමාට කල්පනාවේනම් ඔහුට හෝ නැසීගිය අවසරපත්‍ර ලත් අයගෙන් පැවතෙන්නාවූ කොයිසම් අයකුට හෝ එසේත් නැතහොත් වෙනයම් අයෙකුට හෝ අභිමත පරිදි ඒ ඉඩම් සම්බන්ධයෙන් අවසරපත්‍රයක් නිකුත්කිරීමට පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමාට බලය තිබේ.

5. ඉඩම් කලින් මැන සුදුසුපලය කට්ටිවලට කඩානැත්නම් ඉඩම අවසාන වශයෙන් පවරාදීම එය මනිනතුරු කල් දැමීමට පිළිවන.

6. තෝරගත් ඉල්ලුම්කරුවන් විසින් අක්කරයකට රුපියල් 3 බැගින් මැනුම් ගාස්තු ඉඩම් කච්චේරියෙහිදී තැන්පත් කිරීම අවශ්‍යවිය හැකිය. ඉල්ලුම්කරුගේ ක්‍රියාවක් හෝ ප්‍රමාදයක් නිසා පුත්තලමේ ආණ්ඩුවේ උප දිසාපතිතුමාට උවමනා නැති අමතර මැනීමක් කිරීමට සිද්ධවුවහොත් ඒ මුදල ආපසු දෙනු නොලැබේ. එබඳු ඒ මැනුම් ගාස්තු ඒ ඒ විශේෂ අවස්ථාවලදී ආපසු දීම හෝ නොදීම යුක්ති සහගතදැයි යන්න ගැන ඉඩම් කොමසාරිස්තුමන් විසින් කරනනිරණය අවසාන නිරණය වන්නේය.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 9වෙනි
දින කොළඹදීය.

සී. වී. බ්‍රේන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් තුමා.

දීමට තිබෙන ඉඩම්වල විස්තර.

| මුල් සිතියම. | කොටස් අංක. | ගම. | අක්කරයක සාමාන්‍ය මිල. රු. ශ. | දීමට තිබෙන සාමාන්‍ය බිම් ප්‍රමාණය. අ. රූ. ප. | ඉඩම්වල දැමීමට සුදුසුයයි කල්පනා කරනලද වැවිලි. |
|---|---|---|---|---|---|
| 4,678 | 1 | අඹිප්පල | 35 0 | 7 1 7 | පොල් |
| ,, | 3 | එම | 35 0 | 2 3 22 | එම |
| ,, | 5 | එම | 35 0 | 68 0 16 | එම |

## ටැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

L H 877

මෙහි පහත සඳහන්කරණ ආණ්ඩුවේ ඉඩම වර්ෂ 1935ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් අවුරුද්දකට බදුදීමට ඉල්ලුම් පත්‍ර බස්නාහිර දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාර ගන්නා බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. මෙම මුද්‍රකරණලද ඉල්ලුම්පත්‍ර වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 23වෙනි සිකුරාදා දවල් 11වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එදිනදී ඒවා කඩා බලනවා ඇත. ඉල්ලුම්පත්‍ර සැබෑ බවට ඔප්පුවීමට ඉල්ලුම්කරන්නාවූ සියලු දෙනාම ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ තමන්ම නොහොත් තමන් වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙණීසිටින්ට ඕනෑය.

කොන්දේසි.

1. බදුමිල සම්පූර්ණයෙන්ම වෙන්දේසි දවසේදීම ගෙවිය යුතුයි.

2. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ට වත් යම් ගසක් කපන්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ටත් අවසර නැත.

3. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩම යම් කෙනෙකුට පවරන්ට වත් නැවත බදුදෙන්ටවත් ගැණුම්කාරයාට අවසර නැත.

4. බදුකාරයා විසින් නාගරික සභාවේ සියලුම වරිපනම් කාසි ගෙවන්ට ඕනෑය.

5. බදුකාරයාට මාසයකට කලින් දැනුම්දී වන්දියක් නැතුව නැවත ඉඩම භාරගන්ට ඒජන්ත උන්නාන්සේට හෝ ඔහුගේ බලය පිට ක්‍රියාකරන්නෙකුට බලය තිබේ.

6. මිලේටගත් අය විසින් ඉඩම පිරිසිදුව හොඳකාර තිබෙන්ට ඕනෑවා සහ නාගරික සභාවේ අණපනත්වලට යටත්ව ක්‍රියාකළ යුතුයි.

7. ඒජන්ත උන්නාන්සේගේ කැමැත්ත පරිදි වුවමනා පමණ බඩු පටවන බාන ස්ථාන බදු ගැනුම්කාරයාට අලාබයක් නොගෙවා පිහිටවීමට බලය තබාගන්නවා ඇත.

8. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් අවසරයක් නැතුව කිසිම ගොඩනැගිල්ලක් සාදන්ට බැරිය. ඉවුරට වන හානිය බදු ගැනුම්කාරයාගේ වියදමෙන් සාදවාදෙන්ට ඕනෑය.

9. ඉහත සඳහන්කරන්ට යෙදුන කොන්දේසි කඩකළොත් වන්දි මුදලක් නොගෙවා ගැනුම්කාරයා ඉඩමෙන් අහක්කර නැවත අයිතිවාසිකම් භාරගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

10. යම් ඉල්ලීමක් භාරගන්ට හෝ නොගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

මෙහි සඳහන් ඉඩම.

කිරිලපොනේ පාලමට දකුණෙන් එම ඇළේ බස්නාහිර ඉවුරේ පිහිටි අඩි 50×75 ප්‍රමාණ ඇළට වෙන්කර තිබෙන බිම්කට්ටියේ කොටය බඩු පැටවීමට සහ බෑමට පාවිච්චිකිරීමට වේ.

ආර්. ඇම්. ඇම්. වර්ස්ලි,
බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 9වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

L H 1194
L H 1196

## ආණ්ඩුවේ බදු විකිනීම.

මෙහි සඳහන් ලේඛනයේ දක්වන ආණ්ඩුවේ බදු පහත දක්වන කොන්දේසිවලට යටත්ව, වර්ෂ 1935ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් අවුරුද්දකට විකිණීම සඳහා ඉල්ලුම් පත්‍ර බස්නාහිර දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාර ගන්නා බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. මුද්‍රකරණලද මෙම ඉල්ලුම්පත්‍ර වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 23වෙනි සිකුරාදා දවල් 11වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙණ එදිනදී කඩා බලනු ලැබේ. ඉල්ලුම් පත්‍ර සැබෑබව ඔප්පුවීමට ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ ඉල්ලුම්කරන්නා හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙනීසිටිය යුතුයි. ලේඛනයේ දෙවෙනි කොටුවේ දක්වන ප්‍රකාර ඉල්ලනු ලබන බද්දේ නම පිටකවරවල සලකුණු කොට ඉල්ලුම්පත්‍ර නොහොත් "ටැන්ඩර්ස්" එක එක බද්දට වෙන් වශයෙන් එවිය යුතුයි.

කොන්දේසි.

1. බදුමිල වෙන්දේසි දිනේදී සම්පූර්ණයෙන් ගෙවන්ට ඕනෑය.

2. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ට වත් යම් ගසක් කපන්ටවත් කානු, මායිම්ගල් ආදිය වෙනස් කරන්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට අවසර නැත.

3. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලබාගත් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩමේ කිසිම කොටසක් යම් කෙනෙකුට පවරන්ටවත් නැවත බදුදෙන්ටවත් ගැණුම්කාරයාට අවසර නැත.

4. බදු ඉඩමේ වැට බඳින්ට ඒජන්ත උන්නාන්සේ විසින් නියමකළොත් එසේ කිරීමට බදුකාරයා බැඳිලාය.

5. ගැනුම්කාරයා විසින් ඉඩම් සුද්දෙදත් සහ හොඳකාරයෙන් තියාගන්ටත් නියම පලාත්ආණ්ඩු සභාවේ අණපණත් අනුව ක්‍රියාකරන්ටත් ඕනෑය. තවද සියලුම වරිපනම් ගෙවන්ටත් ඕනෑය.

## රා සහ අරක්කු තැබෑරුමක් පිහිටුවීම සම්බන්ධ කැමැත්ත ගැනීමේ දැන්වීමයි.

### කෑගල්ල දිස්ත්‍රික්කයේ 1934–35 අවුරුද්දතුල රා සහ අරක්කු තැබෑරුමක් පිහිටුවීම සම්බන්ධව කැමැත්ත ගැනීමේ දැන්වීමයි.

වර්ෂ 1925ක්වූ අගෝස්තු මස 14වෙනි දින අංක 146 දරණ මත්පැන් සම්බන්ධ දැන්වීමේ 6වෙනි වගන්තිය යටතේද වර්ෂ 1928ක්වූ අගෝස්තු මස 31වෙනි දින අංක 180 දරණ දැන්වීම යටතේ සහ ඊට පසුව ප්‍රසිද්ධකරණලද මත්පැන් සම්බන්ධ අංක 187, 194, 202, 221, 222 සහ 231 දරණ දැන්වීම් කාරණකොටගෙනද දෙනුලැබූ බලය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සදහන් තැබෑරුමේ ප්‍රයෝජන ලබන ගම්වල අයවලුන්ගෙන් සියයට හැට ගණනේ එම තැබෑරුම (වර්ෂ 1935ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින සිට) විවෘතකිරීමට කැමැතිද යන බව දැනගැනීම සඳහා කැමැත්ත දෙන අයවලුන් ගණන් ගැණීමට මෙහි පහත සදහන් දිනය, වේලාව සහ ස්ථානය නියමකර තිබෙන බව මහ ජනයාගේ දැනගැණීම පිණිස මෙයින් ප්‍රකාශකරණු ලැබේ.

වේලාව උදේ 8 සිට දවල් 12 දක්වාද, දවල් 1කේ සිට හවස 6 දක්වාද.

| තැබෑරුමේ නම. | දිනය. | කැමැත්තගන්න ස්ථානය. | ඡන්දයදෙන්ට නියම ගම්. |
|---|---|---|---|
| රඹුක්කන රා සහ අරක්කු තැබෑරුම | වර්ෂ 1934ක්වූ දෙසැම්බර් මස 15වෙනි දිනදීය | දලුක්ගලේ බෞද්ධ ගැණු පාසැලේදීය | ඔඩවල, දෙම්පේමුල්ල, පින්නවල, හාගමුව, බටාඹූරේ, ඔවතන, කුරන්පොල, කුඩගම, හදගම, මලකාරිය, කොටගම, කොත්තනාවත්ත, මුවපිටිය, කොරිගම්මන, බෙලිගොඩපිටිය, ගොඩගන්දෙනිය, ඊරියගොල්ල, පිලිකුඹුර, වැරැල්ලපොත, දියසුන්නත, කඹුරුදෙනිය, මොව්වප්පුලිය, හුරීමලුව, ඊරියාව, වහව, හල්දූව, කන්හලගමුව, වලල්ගොඩ, කොස්ඹන්න සහ හකුරුලියද්ද. |

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 3වෙනි
දින කෑගල්ලේ කච්චේරියේදීය.

ආර්ජ්. සී. ජීම්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ වම්හ.

---

## සුප්‍රිම් උසාවියේ දැන්වීම්.

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබී තිබෙන අඥාවක බලය කාරණකොට මෙයින් ප්‍රකාශ කරන්නේනම් උතුරු මධ්‍යම දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1934ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින පෙරවරු 11 පැය පටන් මහනුවර මගුල්මඩුව තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑම දෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණී හිටින්ට ඕනෑවත් ඇර අවසරඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සෑමදෙනාටම දන්වන්නෙමි.

ඩබ්ලිව්. ඇස්. ජෝසප්,
උ. ම. දි. උප පිස්කල් වම්හ.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 1වෙනි දින
අනුරාධපුර පිස්කල් කන්තෝරුවේදීය.

---

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබී තිබෙන අඥාවක බලය කාරණකොටගෙන මෙයින් ප්‍රකාශකරන්නේනම් ඌව දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1934ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින පෙරවරු 11 පැය පටන් මහනුවර තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑම දෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණී හිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සෑමදෙනාටම දන්වන්නෙමි.

ඩී. ජේ. මැන්ඩිස්,
ඌවේ පිස්කල් උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 3වෙනි දින
බදුල්ලේ පිස්කල් කන්තෝරුවේදීය.

---

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබී තිබෙන අඥාවක බලය කාරණකොටගෙන මෙයින් ප්‍රකාශ කරන්නේනම් කෑගල්ල දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1934ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින පෙරවරු 11 පැය පටන් මහනුවර තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සෑමදෙනාටම දන්වන්නෙමි.

ඈන්. ජේ. ලබින්වන්,
සබරගමු පළාතේ පිස්කල් උන්නාන්සේ වම්හ.

වර්ෂ 1934ක්වූ නොවැම්බර් මස 3වෙනි දින
රත්නපුරේ පිස්කල් කන්තෝරුවේදීය.

---

## අන්‍ය දැන්වීම.

මාතර දිස්ත්‍රික්කුවේ කන්දබඩ පත්තුවේ පල්ලාවෙල පදිංචි දොන් බස්තියන් ද සිල්වා ජයසිංහ වන මම මාතර දිස්ත්‍රික්කුවේ සිංහල භාෂාවෙන් වැඩකරණ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු මෙන් පත්කරණ පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගිය තැනදී රෙජිස්ත්‍රාර් ජනරල් තුමාගෙන් ඉල්ලුම් කරණබව වර්ෂ 1907 ත් අංක 1 දරණ ආඥාපණතේ 1B දරණ උප ලේඛනයේ 2වෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඩී. බී. ඇස්. ජයසිංහ.

1934 සැප්තැම්බර් 28.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.